## අභ්‍යන්තර සටහන

### පළාත් මහ රෝහල - බදුල්ල

| | |
|---|---|
| දිනය | 2023.03.14 |
| වෙත | සියලුම විශේෂඥ වෛද්‍යවරුන්/සියලුම වෛද්‍යවරුන්/සියලුම ඒකක ප්‍රධානීන් හා අංශ ප්‍රධානීන් |
| වෙතින් | අධ්‍යක්ෂ |
| පිටපත් | ගණකාධිකාරී |
| විෂයය | **ඉදිරියේදී වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයක් පැවතියහොත් රෝගී සත්කාර කටයුතු ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳව දැනුවත් කිරීම** |
| යොමු අංකය | BD/GH/CPMA/1/2013 |

2023.03.15 දින සිට වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයක නියැලෙන බව සමස්ත ලංකා හෙද සංගමය හා සමස්ත ලංකා සෞඛ්‍ය වෘත්තිය සමිති සම්මේලනය මේ වන විට ලිඛිතව දැනුම් දී ඇති ඇති අතර වෙනත් වෘත්තිය සමිති ද එදින සිට වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයක නියැලෙන බවට විවිධ මාධ්‍ය මගින් දැන ගැනීමට ඇත.

02. ඒ අනුව ඉදිරියේදී වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයක් ලෙස වැඩ වර්ජනයක් පවතින සෑම අවස්ථාවකම එම කාල සීමාවේදී පහත පරිදි කටයුතු කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් උපදෙස් ලබා දී තිබේ.

i. අත්‍යවශ්‍යම රෝගී පරීක්ෂණ පෞද්ගලික අංශයෙන් සිදුකර ගැනීම
ii. රෝගීන්ට නියම කරනු ලබන ඖෂධ බාහිර රෝගී අංශයෙන් රෝගීන්ට දින 02කට, සායන රෝගීන්ට දින 07කට, වාට්ටු වලින් බැහැර කරනු ලබන රෝගීන්ට දින 05කට ඔසුසල මගින් ලබා දීම
iii. රෝගීන්ට අවශ්‍ය ආහාර බාහිර සැපයුම්කරුවන්ගෙන් පාර්සල ලෙස ලබා ගැනීම

* i හා iii පියවර සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියා මාර්ග අනුගමනය කර සේවා සැපයුම්කරුවන් තෝරා ගැනීම ගණකාධිකාරි විසින් සිදු කරනු ඇත.

*** බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට පැමිණෙන රෝගීන්ගේ ඖෂධ වට්ටෝරුවෙහි "Medical Officer Incharge, Provincial General Hospital, Badulla" නිල මුද්‍රාව ද රෝගියාගේ නම, ලියාපදිංචි අංකය, දිනය සටහන් කර ලබා දීම, සායන රෝගීන්ට අදාල විශේෂඥ වෛද්‍ය නිලධාරීගේ නිල මුද්‍රාව ද රෝගියාගේ නම, ලියාපදිංචි සායන අංකය, දිනය සටහන් කළ ඖෂධ වට්ටෝරුවක් ලබා දීම හා වාට්ටු වලින් බැහැර කරනු ලබන රෝගීන්ට අදාල විශේෂඥ වෛද්‍ය නිලධාරීගේ නිල මුද්‍රාව ද රෝගියාගේ නම, ඇඳඉහපත් අංකය, දිනය සටහන් කළ ඖෂධ වට්ටෝරුවක් ලබා දීම ද මෙම සියලු රෝගීන් ඔසුසල වෙත යොමු කිරිම ද සිදු කළ යුතුය.**

03. තව ද අවශ්‍යතාවය පරිදි සෞඛ්‍ය කාර්ය සහයකයින්ගේ රාජකාරි ත්‍රිවිධ හමුදා නිලධාරින්ගේ සහයෙන් ඉටුකර ගැනීමට ද උපදෙස් ලබා දී ඇති බැවින් ඉහත පරිදි වෘත්තිය සමිති ක්‍රියා මාර්ගයක් පවතින කාලය තුල හදිසි හා අත්‍යවශ්‍ය ප්‍රතිකාර කටයුතු බිඳ වැටුනහොත් සහය ලබා දෙන ලෙස මේ වනවිටත් යුධ හමුදා කඳවුර වෙත දැනුම් දී ඇත.

04. එබැවින් උද්ගතවිය හැකි එවැනි අවස්ථාවක දී ඉහත උපදෙස් පරිදි හා මෙම සියලුම තත්වයන් සලකා රෝගී ප්‍රතිකාර කටයුතු සැලසුම් කරගනිමින් හැකි උපරිමයෙන් රෝගී සත්කාර සේවාව ලබා දීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

Dr. Upul Karunarathne
MBBS,MSc (Med Admin), MD(Med Admin)